## විභාග සහතිකපත් නිකුත් කිරීමේ එක් දින හා සාමාන්‍ය සේවාව ක්‍රියාත්මක කිරීම

එක් දින සේවය සෑම කාර්යාලයීය දිනකම ක්‍රියාත්මක වන අතර, සහතිකපත්‍ර සම්බන්ධ ගෙවීම් කටයුතු පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා සිදු කෙරේ. 2001 හා ඊට පසු වර්ෂවල විභාග සහතිකපත් www.doenets.lk හෝ https://certificate.donets.lk යන සැබැඳි ඔස්සේ මාර්ගගතව ඉල්ලුම් කළ හැකි අතර, ඊට පෙර වර්ෂවල විභාග සහතිකපත් විභාග දෙපාර්තමේන්තුව වෙත පැමිණ එක් දින සේවාව මගින් හෝ සාමාන්‍ය සේවාව මගින් අයදුම්කොට ලබාගත හැක. එසේ වුවද 2022.11.22 දිනෙන් පසුව ඊමේල් මගින් ඉල්ලීම් ඉදිරිපත් නොකරන ලෙස දන්වන අතර, එවැනි ඉල්ලීම් පිළිබඳ සලකා නොබලන බව ද වැඩිදුරටත් නිවේදනය කෙරේ.

තවද, විභාග සහතිකපත්‍ර නිකුත් කරනු ලබන්නේ එහි හිමිකරුට පමණක් වන අතර, පිළිගත හැකි විශේෂ හේතූන් මත පමණක් අනන්‍යතාව තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් ලේඛන ඉදිරිපත් කිරීමෙන් අයදුම්කරුගේ මවට, පියාට, කලත්‍රයාට හෝ දරුවන් වෙත සහතික නිකුත් කිරීම සලකා බලනු ලැබේ. සහතිකපත්‍ර අයදුම් කිරීමේදී හා ලබා ගැනීමේදී සහතිකපත්‍රය හිමිකරුගේ අනන්‍යතා පත්‍රයක් (ජාතික හැඳුනුම්පත / වලංගු විදේශ ගමන් බලපත්‍රය / වලංගු රියදුරු බලපත්‍රය) ඉදිරිපත් කිරීම මගින් සහතිකයේ හිමිකාරීත්වය තහවුරු කිරීම අනිවාර්ය වන අතර, උප්පැන්න සහතිකය / විවාහ සහතිකය අවශ්‍ය විටකදී ඉදිරිපත් කළ යුතු ය.

සහතිකපත්‍රයේ සඳහන් නම සහ අනන්‍යතා පත්‍රයේ සඳහන් නම අතර වෙනස්කම් ඇත්නම් නාම සංශෝධනය සඳහා පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව වෙත යොමු විය යුතුය.

විභාග අංක සොයාදීමේ සේවාව යටතේ අයදුම්පත ඉදිරිපත් කොට රාජකාරි දින 10කට පසුව විභාග අංක ලබාදීම සිදු කරනු ලැබේ.

ඕස්ට්‍රේලියානු වීසා සඳහා සහතිකපත්‍ර නිකුත් කිරීමේදී වලංගු විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර, ඒ සඳහා ඉල්ලුම් කිරීමේදී ද එහි ඡායා පිටපතක් සමග වලංගු විදේශ ගමන් බලපත්‍රය ලබා දිය යුතු ය.

අයදුම්පත් භාර දුන් දින සිට මාස 3ක් ඇතුළත ලබා නොගන්නා විභාග අංක හා සහතිකපත්‍ර සම්බන්ධයෙන් වගකියනු නොලබන අතර, එවැනි සහතික හා විභාග අංක ලබා ගැනීම සඳහා නැවත මුදල් ගෙවා ඉල්ලුම් කළ යුතුය.

එල්.එම්.ඩී. ධර්මසේන
විභාග කොමසාරිස් ජනරාල්